රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 04/2011(ii)

මගේ අංකය: CS/ICTS/01/6/2006 Amd.
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07
2014.08.28

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයට 2009.07.01 දිනට අන්තර්ග්‍රහණය කර ඇති නිලධාරීන් එදින සිට නියමිත පන්තියේ නැවත අන්තර්ග්‍රහණය කිරීම.**

අංක 1631/20 හා 2009 දෙසැම්බර් මස 09 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 2009 දෙසැම්බර් 08 දිනැති ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා එම සේවයට අන්තර්ග්‍රහණය කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2011.02.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 04/2011 සහ 2012.08.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 04/2011 (i) කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

**02. ශ්‍රේණි ක්‍රමයට නැවත අන්තර්ග්‍රහණය කිරීම.**

(අ) අන්තර්ග්‍රහණය කිරීම සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ 2011.02.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2011 හා 2012.08.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2011(i) සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක PSC/ET/3/1/10-I වෙළුම හා 2011.11.16 දිනැති ලිපියේ තීරණ පරිදි 2009.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවයට අන්තර්ග්‍රහණය කර ඇති නිලධාරීන්ගේ පූර්ව සේවා කාලය, සුදුසුකම් හා ලබමින් සිටි වැටුප යනාදී කරුණු සලකා බලා පහත 2.1, 2.2, 2.3, 2.4 හා 2.5 හි පරිදි 2009.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(ආ) නැවත අන්තර්ග්‍රහණය කරණු ලබන නිලධාරීන්ගේ වැටුප 2009.07.01 දින සිට වලංගුවන පරිදි ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වන වගන්තියේ විධිවිධාන අනුව පරිවර්තනය කරනු ලබන අතර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වන උපවගන්තියේ විධිවිධාන අදාල නොවනු ඇත. එසේ වුවද පැවති වැටුප් වර්ධක දිනය වෙනස් නොවේ.

**2.1 3 පන්තියේ II ශ්‍රේණියට නැවත අන්තර්ග්‍රහණය කිරීම.**

පහත දැක්වෙන සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් 2009.07.01 සිට ක්‍රියාත්මක වන පරිදි සේවයේ 3 පන්තියේ II ශ්‍රේණියට නැවත අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(අ) පත්වීම ස්ථිර කර තිබීම.
(ආ) 2009.07.01 දිනට සේවාවේ 3 පන්තියේ III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කර තිබීම.
(ඇ) පූර්ව තනතුරේ පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත්ව තිබීම.
(ඈ) 2009.07.01 දිනට පූර්වාසන්න වසර 10 තුල අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල මට්ටමක කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(ඉ) 2009.07.01 දිනට පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(ඊ) 2009.07.01 දිනට අවම වශයෙන් පූර්වාසන්න වසර 10 ක සක්‍රීය සේවා කාලයක් සපුරා තිබීම.

(උ) 2009.07.01 දිනට MN 1-2006 A වැටුප් පරිමාණයේ හෝ ඊට අනුරූපී වැටුප් ක්‍රමයක රු. 16,045ක් හෝ ඊට ඉහල පියවරක වැටුපක් ලබමින් සිටිම.

**2.2 3 පන්තියේ I ශ්‍රේණියට නැවත අන්තර්ග්‍රහණය කිරීම.**

පහත දැක්වෙන සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් 2009.07.01 සිට ක්‍රියාත්මක වන පරිදි සේවයේ 3 පන්තියේ I ශ්‍රේණියට නැවත අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(අ) පත්වීම ස්ථිර කර තිබීම.

(ආ) 2009.07.01 දිනට සේවාවේ 3 පන්තියේ III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කර තිබීම.

(ඇ) පූර්ව තනතුරට අදාලව පළමුවන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණ ඇත්නම් එම කඩඉම් සමත්වීම හෝ එකී බඳවාගැනීම් පටිපාටියෙහි එක් කඩඉමක් පමණක් ඇත්නම් එය සමත්වී තිබීම.

(ඈ) ශ්‍රේණිගත කිරීම සඳහා සලකා බලනු ලබන සේවා කාලය තුල අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල මට්ටමක කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(ඉ) 2009.07.01 දිනට පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(ඊ) 2009.07.01 දිනට අවම වශයෙන් පූර්වාසන්න වසර 20 ක සක්‍රීය සේවා කාලයක් සපුරා තිබීම.

(උ) 2009.07.01 දිනට MN 1-2006 A වැටුප් පරිමාණයේ හෝ ඊට අනුරූපී වැටුප් ක්‍රමයක රු. 17,985ක් හෝ ඊට ඉහල පියවරක වැටුපක් ලබමින් සිටිම.

**2.3 2 පන්තියේ I ශ්‍රේණියට නැවත අන්තර්ග්‍රහණය කිරීම.**

පහත දැක්වෙන සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් 2009.07.01 සිට ක්‍රියාත්මක වන පරිදි සේවයේ 2 පන්තියේ I ශ්‍රේණියට නැවත අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(අ) පත්වීම ස්ථිර කර තිබීම.

(ආ) 2009.07.01 දිනට සේවාවේ 2 පන්තියේ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කර තිබීම.

(ඇ) සේවයේ 2 පන්තියට අන්තර්ග්‍රහණය කිරීමට අදාල වන අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

(ඈ) පූර්ව තනතුරේ පළමු වන කාර්යක්ෂමතා කඩඉම සමත්වී තිබීම/ නිදහස් කර තිබීම.

(ඉ) 2009.07.01 දිනට අවම වශයෙන් වසර 10 ක සක්‍රීය සේවා කාලයක් සපුරා තිබීම.

(ඊ) (i) 2009.07.01 දිනට MN 5-2006 A වැටුප් පරිමාණයේ රු.21,380ක් හෝ ඊට ඉහල වැටුපක් ලබමින් සිටිම

හෝ

(ii) 2009.07.01 දිනට MN 6-2006 A වැටුප් පරිමාණයේ හෝ පූර්වයවයෙන් වූ ඊට අනුරූපී වැටුප් ක්‍රමයක රු. 21,245ක් හෝ ඊට ඉහල පියවරක වැටුපක් ලබමින් සිටීම.

**2.4 1 පන්තියේ II ශ්‍රේණියට නැවත අන්තර්ග්‍රහණය කිරීම.**

පහත දැක්වෙන සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් 2009.07.01 සිට ක්‍රියාත්මක වන පරිදි සේවයේ 1 පන්තියේ II ශ්‍රේණියට නැවත අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(අ) පත්වීම ස්ථිර කර තිබීම.
(ආ) සේවාවේ 1 පන්තියේ III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කර තිබීම.
(ඇ) අංක 1631/20 හා 2009.12.09 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කල සේවා ව්‍යවස්ථාවේ 8.6.1 (ඉ) හි සඳහන් සුදුසුකම් සපුරා තිබීම හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 4/2011 හි 5.3 (ii) හි සඳහන් පරිදි තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සම්පූර්ණ කර තිබීම.
(ඈ) පූර්ව තනතුරේ පළමු වන කාර්යක්ෂමතා කඩඉම සමත්වී තිබීම/ නිදහස් කර තිබීම.
(ඉ) (i) 2009.07.01 දිනට SL 1-2006 වැටුප් පරිමාණයේ හෝ පූර්වයෙන් ඊට අනුරූපී වූ වැටුප් පරිමාණයක අවම වශයෙන් වැටුප් වර්ධක 10 ක් ලබා වසර 10ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

හෝ

(ii) 2009.07.01 දිනට SL 1-2006 වැටුප් පරිමාණයේ හෝ පූර්වයෙන් වූ ඊට අනුරූපී වැටුප් ක්‍රමයක රු. 30,175ක් හෝ ඊට ඉහල පියවරක වැටුපක් ලබමින් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ මට්ටමේ තනතුරක් දරමින් සිටි නිලධරයෙකු වීම.

**2.5 1 පන්තියේ I ශ්‍රේණියට නැවත අන්තර්ග්‍රහණය කිරීම.**

පහත දැක්වෙන සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් 2009.07.01 සිට ක්‍රියාත්මක වන පරිදි සේවයේ 1 පන්තියේ I ශ්‍රේණියට නැවත අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(අ) පත්වීම ස්ථිර කර තිබීම.
(ආ) 2009.07.01 දිනට සේවාවේ 1 පන්තියේ III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කර තිබීම.
(ඇ) අංක 1631/20 හා 2009.12.09 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කල සේවා ව්‍යවස්ථාවේ 8.6.1 (ඉ) හි සඳහන් සුදුසුකම් සපුරා තිබීම හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 4/2011 හි 5.3 (ii) හි සඳහන් පරිදි තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සම්පූර්ණ කර තිබීම.
(ඈ) පූර්ව තනතුරේ දෙවන කාර්යක්ෂමතා කඩඉම සමත්වී තිබීම/ නිදහස් කර තිබීම.
(ඉ) (i) 2009.07.01 දිනට SL 1-2006 වැටුප් පරිමාණයේ වැටුප් ලබමින් ඊට අදාල තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ අධ්‍යක්ෂ මට්ටමේ තනතුරක් දරමින් සිටින නිලධරයෙකු වීම.

හෝ

(ii) 2009.07.01 දිනට SL 1-2006 වැටුප් පරිමාණයේ II ශ්‍රේණියට අදාල වැටුපක් ලබමින් II ශ්‍රේණියේ වසර හතකට (07) වැඩි සේවා කාලයක් සපුරා ඇති තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ මට්ටමේ තනතුරක් දරමින් සිටි නිලධරයෙකු වීම.

**03.** ඉහත 2.1, 2.2, 2.3, 2.4 හා 2.5 වගන්තින්හි දක්වා ඇති විධිවිධාන යටතේ නැවත අන්තර්ග්‍රහණය නොවන නිලධාරීන් ඔවුන්ගේ පූර්ව සේවා කාලය ද සැලකිල්ලට ගෙන සේවා ව්‍යවස්ථාවේ දක්වා ඇති අවශ්‍යතා සම්පූර්ණ කරන දිනට ඊළඟ ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

**04.** නැවත අන්තර්ග්‍රහණය වන නිලධාරීන් ඊළඟ උසස්වීම සඳහා සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි සුදුසුකම් සපුරාගත යුතුවේ. එසේ වුවද නැවත අන්තර්ග්‍රහණය කිරීමේ දී සලකා බලනු ලැබූ සේවා කාලයට අමතරව ඇති පූර්ව සේවා කාලය ඊළඟ උසස්වීමේදී පමණක් සලකා බලනු ඇත.

**පී.බී. අබේකෝන්**
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය